**කාර්මික තාක්ෂණ ආයතනය - 2013**

කාර්මික තාක්ෂණ ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනතේ VII කොටසේ 40 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම.**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කාර්මික තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව පාරිතෝෂික වෙන් කිරීම් ගණනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා පාරිතෝෂික දීමනා වෙන් කිරීම් රු.274,025 ක් අඩුවෙන් සිදුකර තිබුණි. ඒ මත සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) භෞතික සත්‍යාපන වාර්තාව අනුව 2013 දෙසැම්බර් 31 දිනට පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය රු.9,340,426 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තොගය රු.9,612,559 ක් වී තිබුණි. ඒ මත සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා අවසන් තොගය රු.272,133 කින් වැඩියෙන් දක්වා තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

දේපල, පිරියත හා උපකරණ ගිණුමෙහි දක්වා ඇති පිරිවැය වටිනාකම සහ සමාලෝචිත වර්ෂයට අදාල භෞතික සත්‍යාපන වාර්තා අනුව පිරිවැය වටිනාකම පහත පරිදි වෙනස් වී තිබුණි.

| අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව පිරිවැය වටිනාකම | භෞතික සත්‍යාපන වාර්තාව අනුව පිරිවැය වටිනාකම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| යන්ත්‍ර සූත්‍ර හා රසායනාගාර උපකරණ | 668,100,727 | 694,658,745 | 26,558,018 |
| ලී බඩු හා කාර්යාල උපකරණ | 44,733,359 | 39,103,373 | (5,629,986) |
| පරිගණක යන්ත්‍ර | 45,913,890 | 42,617,309 | (3,296,581) |
| පුස්තකාල පොත් සහ සඟරා | 13,038,343 | 13,893,059 | 854,716 |
| එකතුව | 771,786,319 | 790,272,486 | 18,486,167 |

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ කිහිපයක සිට ගිණුම් තුල ඇතුලත්වූ අගරු චෙක්පත් හා වෙනත් ණයගැති ශේෂ එකතුව රු. 617,796 ක් සමාලෝචිත වර්ෂය තුලදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවක සිට මුලා ප්‍රකාශන තුළ ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.83,339 ක් වූ ටෙන්ඩර් තැන්පතු හා එකතුව රු.160,746 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ මැයි 30 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ නියෝග අංක 16 ප්‍රකාරව විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම්වල කොන්දේසි කඩකළ නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 7,810,032 ක් විගණිත දිනය වූ 2014 ජුනි 25 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඈ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය යටතේ සේවයෙන් ඉවත්ව ගිය හා සේවයේ රැඳී සිටින නිලධාරීන් සඳහා ගෙවිය යුතු වැටුප් වශයෙන් 2009 වර්ෂයේ සිට රු. 7,030,873 ක වෙන් කිරීමක් කර තිබුණු අතර, එයින් 2013 දෙසැම්බර් 31 දින වනවිටද රු.6,980,352 ක් ගෙවා නොතිබුණි.

**2.2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(1) වගන්තියේ 6.5.3 ඡේදය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) (ඇ) | අතුරු අග්‍රිමයන් දෙන ලද කාර්යය අවසන් වූ වහාම පියවිය යුතු වුවත්, ආයතනය විසින් මාස 01 සිට මාස 07 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් යුතුව අතුරු අග්‍රිම පියවා තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් සමීක්ෂණය සඳහා නිලධාරීන් 4 දෙනෙකුගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබුණු අතර රු. 13,581,898 ක් වටිනා පරිගණක මෘදුකාංග හා උපාංග සහ රු.4,512,594 ක් වටිනා අනෙකුත් වත්කම් සත්‍යාපනය කර නොතිබුණි. |
| (ඈ) | 2011 අප්‍රේල් 21 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2011/1 දරන මුදල් හා ක්‍රම සම්පාදන චක්‍රලේඛය. | විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමකින් තොරව රු. 38,469,075 ක් වටිනා කැනඩා ව්‍යාපෘතියක් සහ රු. 9,471,996 ක් වටිනා ඉන්දු ශ්‍රී ලංකා ව්‍යාපෘතියක් පිළිවෙලින් 2012 අප්‍රේල් මාසයේදී සහ 2013 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කර තිබුණි. |

| | |
|---|---|
| (ඉ) 2000 ජනවාරි 19 දිනැති අංක 380 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | |
| (i) 01 වගන්තිය | උපදේශන සේවා සඳහා පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) 7.1 වගන්තිය | උපදේශන සේවා ආදායමින් ඍජු පිරිවැය අඩු කළ පසු සියයට 10 සිට සියයට 25 දක්වා ප්‍රතිශතයක මුදලක් ආයතනය මඟින් රඳවාගෙන භාණ්ඩාගාරයේ විශේෂ අරමුදලක් වෙත මාස 03කට වරක් ප්‍රේෂණය කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඊ) 2004 පෙබරවාරි 11 දිනැති අංක ඩීඑම්එස්/ඊආර්එස්ටී/21-4/ වෙළුම ii දරන කළමනාකරණ සේවා අධ්‍යක්ෂකගේ ලිපිය. | එක් නිලධාරියෙකුට මාස දෙකක වැටුප හෝ රු.20,000 යන දෙකෙන් අඩු අගය දිරි දීමනාවක් ලෙස ලබාදීමට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව 2012 වර්ෂය සඳහා නිලධාරීන් 307 දෙනෙකුට ලබාදිය හැකි උපරිම දිරි දීමනාව රු. 6,140,000 ක් වුවද සමාලෝචිත වර්ෂය තුළදී රු. 1,802,397 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම 2013 වර්ෂය සඳහා එක් අයෙකුට රු. 27,500 බැගින් නිලධාරීන් 395 කට දිරි දීමනා සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණු අතර අනුමත ප්‍රමාණයට වඩා රු. 2,962,500 ක් වැඩියෙන් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.39,177,699 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා රු.22,628,443 ක අතිරික්තයක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,549,256 ක වැඩි වීමක් පෙන්නුම් කෙරුණි. මේ සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ක්ෂයවීම මත භාණ්ඩාගාර ප්‍රදාන කපා හැරීම සියයට 49 කින් ද පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම මත භාණ්ඩාගාර ප්‍රදාන කපා හැරීම සියයට 46 කින් ද ආදායම් සියයට 30 කින් හා වෙනත් ආදායම් සියයට 35 කින් වැඩිවීම හේතු වී ඇති බව නිරීක්ෂණය විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව මණ්ඩලයේ කාරක ප්‍රාග්ධනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සියයට 38ක පිරිහීමක් නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ආයතනය විසින් මෙහෙයවනු ලබන පර්යේෂණ ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ප්‍රමාද වූ ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුළදී ව්‍යාපෘති 07 ක් නිම කිරීමට නියමිත වූ දිනයට වඩා මාස 03 සිට මාස 23 දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් යුතුව නිම කර තිබුණි.

(ii) අංක: ටීජී12/00/04 දරන " Continue the Fabrication of Tape Calibration Facility in IML" ව්‍යාපෘතිය රු. 1,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2006 වර්ෂයේදී ආරම්භ කර 2010 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. එහෙත්, ව්‍යාපෘතිය මෙහෙයවනු ලැබූ නිලධාරියා 2010 ජනවාරි 17 දින සිට 2012 ජනවාරි 16 දින දක්වා වසර 2 ක කාලයක් අධ්‍යයන නිවාඩු ලබා ගැනීම හේතුවෙන් එම ව්‍යාපෘතිය වසර 03 ක ප්‍රමාද කාලයකින් යුතුව 2013 දෙසැම්බර් මාසයේදී නිම කර තිබුණි. අධ්‍යයන නිවාඩු ලබා ගත් නිලධාරියා වෙනුවට වෙනත් නිලධාරියෙකු යොදවා ව්‍යාපෘතිය අප්‍රමාදව සාර්ථක කර ගැනීමට ආයතනය විසින් කටයුතු කර නොතිබූ අතර අධ්‍යයන නිවාඩු කාලය වසර 2 ක් වුවත් ව්‍යාපෘතිය වසර 3 ක ප්‍රමාද කාලයකින් යුතුව සම්පූර්ණ කර තිබුණි.

*(ආ) අතහැර දැමූ ව්‍යාපෘති*

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) අංක: ටීජී/08/24 දරන " Replacement of Sulphur promoting sqmigat" ව්‍යාපෘතිය පර්යේෂණ නිලධාරීන් තිදෙනෙකුගේ සහභාගිත්වයෙන් රු.2,000,000 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන මත 2011 මැයි මාසයේදී ආරම්භ කර 2014 මැයි මාසයේදී නිම කිරීමට අපේක්ෂිතව තිබුණු අතර මෙම ව්‍යාපෘතිය සඳහා 2013 දෙසැම්බර් 31 දිනට රු.93,482 ක පිරිවැයක් දරා තිබුණි. මෙයින් එක් පර්යේෂණ නිලධාරියෙකු 2011 දෙසැම්බර් 09 දින විශ්‍රාම ගැනීමට නියමිත බව නොසලකා හරිමින් ව්‍යාපෘතිය සැලසුම් කිරීම හේතුවෙන් එම ව්‍යාපෘතිය අතහැර දමා තිබූ අතර වෙනත් පර්යේෂණ නිලධාරියෙකු හෝ යොදවා ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) අංක: එෆ්පී 83 දරන " Enhancing Environmental Performance in Key Sri Lankan Export Sectors – EEPEx" ව්‍යාපෘතිය යුරෝපා සංගමයේ යුරෝ 683,528 ක මූල්‍යාධාර යටතේ 2009 මාර්තු මාසයේදී ආරම්භ කර 2012 අගෝස්තු මාසයේදී නිම කිරීමට අපේක්ෂිතව තිබුණි. එහෙත්, ආයතනික ඉහළ කළමනාකරණයේ පැවති දුර්වලතා හේතුවෙන් එම සංගමය විසින් මූල්‍යාධාර ලබා දීම නවත්වා තිබුණු අතර අලාභ පියවා ගැනීම සඳහා 2014 අගෝස්තු 25 දිනට කල්පිරෙන යුරෝ 81,097.48 ක් වටිනා හරපතක් ආයතනය වෙත නිකුත් කර තිබුණි.

## 4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ සනීපාරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් වූ කොන්ත්‍රාත් ගිවිසුම හා රු.36,644 ක් වටිනා කාර්ය සාධන බැඳුම්කරය දීර්ඝ කිරීමෙන් තොරව, සමාලෝචිත වර්ෂයේ මාස 05 ක කාලයක් සඳහා රු. 581,608 ක මුදලක් පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි.

(ආ) ආයතනයේ සනීපාරක්ෂක සේවා සැපයීම සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය මඟින් තෝරාගත් ආයතනය වෙනුවට මසකට රු.32,352කින් මිල වැඩි වෙනත් ආයතනයක් 2013 නොවැම්බර් 11 දින පත්කර තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු. 1,815,377 ක් වූ බැංකු ගිණුම් ශේෂ 03 ක් වසර 05 කට අධික කාලයක් තිස්සේ ක්‍රියාත්මක නොවූ අතර එම ගිණුම්වල ඇති මුදල් සමාලෝචිත වර්ෂය තුළදී ද අදාල කටයුත්තට හෝ වෙනත් ඵලදායි කටයුත්තක් සඳහා උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අංක: එෆ්පී 96 දරන " Value Addition to Fruits and Vegetables by Clarifying, Concentrating" ව්‍යාපෘතිය ජාතික විද්‍යා පදනමේ රු. 1,920,000 ක මූල්‍යාධාර යටතේ 2011 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කර 2013 සැප්තැම්බර් මාසයේදී නිම කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ රු. 654,886 ක් වටිනා යන්ත්‍රයක් මුළු ඇස්තමේන්තු පිරිවැය රු.126,910 කින්ද ඉක්මවමින් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු අතර එම යන්ත්‍රය අවශ්‍යතාවයට නොගැලපීම හේතුවෙන් විගණිත දිනය වූ 2014 ජුනි 25 දින වන විටත් නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

"Waste Water Treatment Plant" නම්වූ යන්ත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත රු. 10,752,000 ක මුදලකට උප කොන්ත්‍රාත්තුවක් ලබාදී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මෙම උප කොන්ත්‍රාත්තුව ලබාදීම සම්බන්ධයෙන් සේවා ගිවිසුමකට එළඹ නොතිබුණු අතර කාර්යසාධන බැඳුම්කරයක්ද ලබා ගෙන නොතිබුණි.

(ආ) උප කොන්ත්‍රාත්තුව ලබා දුන් ආයතනය විසින් ලබා දී තිබුණු රු. 3,648,000 ක් වටිනා අත්තිකාරම් බැඳුම්කරය 2012 සැප්තැම්බර් 20 දින කල් ඉකුත් වී තිබුණු අතර එය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සේවාදායකයාගේ ඉල්ලීමට අනුව 2012 අප්‍රේල් 23 දින සිට මාස 4 ක් ඇතුලත යන්ත්‍රාගාරයේ ඉදිකිරීම් නිම කළ යුතු වුවත්, 2013 මාර්තු මාසයේදී වැඩ නිම කර භාර දී තිබුණු නමුත් යන්ත්‍රාගාරය ක්‍රියා කරවීමේ අත්පොත හා අනෙකුත් වාර්තා විගණිත දිනය වූ 2014 මාර්තු 17 තෙක්ම ලබා දී නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

2013 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත | තත්‍ය | කොන්ත්‍රාත් | අතිරික්ත | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 52 | 34 | - | - | 18 |
| තෘතියික | 148 | 140 | 12 | 4 | - |
| ද්විතියික | 106 | 101 | 20 | 15 | - |
| ප්‍රාථමික | 86 | 60 | 13 | - | 13 |
| | 392 | 335 | 45 | 19 | 31 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීමකින් තොරව තෘතියික මට්ටමේ තනතුරක් වූ පර්යේෂණ විද්‍යාඥයින් අනුමත සංඛ්‍යාව ඉක්මවා 09 දෙනෙකු වෙත ස්ථිර පත්වීම් ලබා දී

තිබුණු අතර, එම තනතුරටම නිලධාරීන් 11 දෙනෙකු කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගෙන තිබුණි.

(ආ) ආයතනය වෙත අත්‍යවශ්‍ය ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වන ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රධාන අලෙවි කළමනාකරණ නිලධාරී සහ පර්යේෂණ සහකාර තනතුරු පුරප්පාඩු 5 ක් පිරවීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය තුල ස්ථිර නිලධාරීන් බඳවා ගැනීම සඳහා පුරප්පාඩු පැවතියද ස්ථිර පත්වීම් ලබා නොදී කොන්ත්‍රාත් පදනමට නිලධාරීන් බඳවාගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| තත්ත්වය | පුරප්පාඩු සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනමට බඳවා ගත් සංඛ්‍යාව |
|---|---|---|
| රියදුරු | 04 | 03 |
| පුහුණු | 07 | 02 |
| අර්ධ පුහුණු | 14 | 05 |

(ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 හා 9.10 වගන්ති උල්ලංඝනය කරමින් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් භාණ්ඩාගාර ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව නිලධාරීන් 06 දෙනෙකුගේ තනතුරු නාමයන් 2012 ජුලි 01 දින සිට වෙනස් කර තිබුණු අතර සියයට 50 ක දුරකථන ගාස්තු දීමනාවක් සහ ප්‍රවාහන දීමනා අනුමත කර තිබුණි. ඒ මත 2012 ජුලි 01 දින සිට විගණිත දිනය වූ 2013 නොවැම්බර් 30 දින දක්වා දුරකථන ගාස්තු දීමනා සඳහා රු.200,500 ක් ද ප්‍රවාහන දීමනා සඳහා රු. 548,510 ක් ද ආයතනය විසින් ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තත්‍ය ආදායම් හා වියදම් සැසඳීමේදී අයිතම 07ක් සඳහා සියයට 16 සිට සියයට 349 දක්වා විචලනයක් දක්නට ලැබීම නිසා අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

### 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තාව මුල්‍ය වර්ෂය අවසාන වී දින 150 ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2011 හා 2012 වර්ෂවල වාර්ෂික වාර්තා පිළිවෙලින් 2013 ජූලි 23 දින හා 2014 ජුනි 09 දින සභාගත කර තිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය පාලනය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය
(උ) ව්‍යාපෘති පරිපාලනය